සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

87 S I

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 10 - 2018

විභාග අංකය ................................... සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය කාලය පැය 01 යි.

* සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
* අංක 01 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඔබට දී ඇති කොටු කොළයේ නිවැරදි අංකයට සැසඳෙන කවය තුළ ( ✖ ) ලකුණ යොදන්න.

01. සන්නිවේදන ස්වරූප ලෙස දැක්වෙන්නේ,
01. ග්‍රාහකයින් තොරතුරු ලබාගන්නා ආකාරයයි.
02. සන්නිවේදනයේ යෙදෙන සංඛ්‍යාවයි.
02. ප්‍රතිචාරයක් සන්නිවේදනය කරන මාධ්‍යයයි.
04. වචන පමණක් මාධ්‍ය කොටගත් සන්නිවේදනයයි.

02. පැලියොලිතික් යුගය යනු,
01. දඩයම් යුගයයි.
02. නූතන යුගයයි.
03. ප්‍රාග් ඓතිහාසික යුගයයි.
04. ගොවි යුගයයි.

03. රූපවාහිනී නාලිකාවල ප්‍රචාරය වන ඉන්දියානු ටෙලි නාට්‍ය බොහෝ පාසල් සිසුන් ප්‍රතික්ෂේප කරමින් සිටින බව සමීක්ෂණයකින් හෙළි විය. මෙයට හේතුව විය හැක්කේ,
01. බොහෝ පාසල් සිසුන් තුළ හික්මීමක් ඇති වීමයි.
02. බොහෝ පාසල් සිසුන් විචාරශීලී වීමයි.
03. ඔවුන් වෙනත් විදේශීය ටෙලි නාට්‍ය තෝරා ගැනීමයි.
04. ලකුණු ඉහළ දමා ගැනීමට ඔවුන් යොමු වීමයි.

* **පහත සඳහන් වන්නේ ප්‍රාථමික සන්නිවේදන විධි කිහිපයකි.**
A- ගිනිමැලය B- කොළ අතු එල්ලීම C- අණ බෙරය D- හූව

04. මෙයින් දුරස්ථ සන්නිවේදනය සඳහා යොදා ගන්නා ක්‍රමයක් නොවන්නේ
01. A ය. 02. B ය. 03. C ය. 04. D ය.

05. නිමල් කමල්ට ලබාදුන් දුරකථන ඇමතුම ඔහු අසල සිටි දියණියගේ කෑ ගැසීම නිසා පැහැදිළිව නොඇසුණි. මෙම සිදුවීම පිළිබඳ විචාරණය කරනු ලබන සන්නිවේදන ආකෘතිය වන්නේ,
01. හැරල් ඩී ලැස්වෙල්ගේ ය.
02. මාෂල් මැක්ලුහන්ගේ ය.
03. ක්ලෝඩ් ෂැනෝන් හා වොරන් වීවර්ගේ ය.
04. ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල්ගේ ය.

06. පහත සිදුවීම් ඇසුරින් සන්නිවේදකයා ග්‍රාහකයාට ප්‍රතිචාරය ලබාදීමේ අරමුණු ඉටු වූ අවස්ථාව වන්නේ,
01. ගුරුතුමා ලබාදුන් අභ්‍යාසය නිමල් විසින් කිරීම.
02. ගුරුතුමා අභ්‍යාසය නිමල් කමල්ගේ පොතෙන් බලා පිටපත් කිරීම.
03. ගුරුතුමා ලබාදුන් අභ්‍යාසය නිමල් කමල් ලවා පිටපත් කිරීම.
04. ගුරුතුමා ලබාදුන් අභ්‍යාසය කොටසක් නිමල් විසින් කිරීම.

07. නිෂාදි තම සාමාන්‍ය පෙළ විභාගයේ විෂයන් වලට තොරතුරු රැස් කර ගැනීම සඳහා රූපවාහිනියේ ජාතික පාසල වැඩසටහන, ගුවන් විදුලි අධ්‍යාපන සේවා වැඩසටහන හා සතර පුවත්පත භාවිතා කරයි. මාධය අනුව, ඇය සම්බන්ධ වී සිටින ග්‍රාහක ස්වභාවයේ පිළිවෙල වන්නේ,
01. ශ්‍රාවකයා, පාඨකයා, ප්‍රේක්ෂකයා.
02. ප්‍රේක්ෂකයා, ශ්‍රාවකයා, ලේඛකයා.
03.. ශ්‍රාවකයා, ප්‍රේක්ෂකයා, පාඨකයා.
04. ප්‍රේක්ෂකයා, ශ්‍රාවකයා, පාඨකයා.

08. සන්නිවේදකයා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
01. සන්නිවේදන ක්‍රියාවලිය ආරම්භ කරන්නායි.
02. සන්නිවේදන ක්‍රියාවලිය සැලසුම් කරන්නායි.
03. සංදේශය ලබාදීමට යෝග්‍ය මාධ්‍ය තෝරාගනු ලබන්නායි.
04. සන්නිවේදනය ක්‍රියාවලිය තුළ ප්‍රතිචාරය ලබාගන්නා පුද්ගලයාය.

09. සන්නිවේදනයේ ඓතිහාසික වර්ධනය තුළ සිදු වූ වඩා වැදගත්ම සන්ධිස්ථානය වන්නේ,
01. නූතන මුද්‍රණ ශිල්පය සොයා ගැනීමයි. 02. සිංහල හෝඩිය සොයා ගැනීමයි.
03. කඩදාසි නිර්මාණය කර ගැනීමයි. 04. විවිධ දෑ යොදා ගෙන ලිවීමයි.

10. ද්විමාර්ගික සන්නිවේදනය සිදුවීමට අවම ඉඩක් ඇත්තේ,
01. වෛද්‍යවරයා රෝගියාගේ රෝග විනිශ්චයේදී ය.
02. ගුරුවරයා ශිෂ්‍යයාට පාඩමක් ඉගැන්වීමේ දී ය.
03. විදුහල්පතිතුමා ශිෂ්‍යයාට අවවාද කිරීමේදී ය.
04. පියා දරුවාගේ අධ්‍යාපන කටයුතු පිළිබඳ විමසා බැලීමේදී ය.

11. පුද්ගලයෙකුට හුදකලාව ජීවත්වීම අපහසු කාර්යයකි. එබැවින් සෑම අයෙකුම සමාජ සම්බන්ධතා ඇතිකර ගනියි. සමාජ සම්බන්ධතා පැවැත්වීමේ දී බහුල වශයෙන් යොදා ගන්නා සන්නිවේදනය වර්ගයකි.
01. සමූහ සන්නිවේදන. 02. අන්තර්පුද්ගල සන්නිවේදන.
03. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය. 04. ජන සන්නිවේදනය.

12. ලැස්වෙල් හා ෂැනෝන් වීවර් ආකෘති වල දක්නට ලැබෙන පොදු ලක්ෂණයක් නොවන්නේ,
01. සන්නිවේදකයාට ප්‍රමුඛ තැන ලැබීමයි.
02. සන්නිවේදන ක්‍රියාවලිය ඒකමාර්ගික වීමයි.
03. ප්‍රතිචාර ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය සිදුනොවීමය.
04. බාධක පිළිබඳව දක්වා තිබීමය.

13. පාඩම අවසානයේ ගුරුතුමිය විසින් බහුජන සන්නිවේදනයේ ලක්ෂණ කිහිපයක් ඉදිරිපත් කරන ලෙස සිසුන්ට පැවසුවාය. එහිදී සිසුන් සිව් දෙනෙකු ඉදිරිපත් කළ කරුණු පහත දැක්වේ.
1. කුමාර - සන්නිවේදකයා හා ග්‍රාහකයා අභිමුඛ නොවේ.
2. සමන් - මූලික වශයෙන් ද්විමාර්ගික වේ.
3. ලලිත් - සංවිධිත ආයතනයක් මඟින් ක්‍රියාත්මක වේ.
4. කවිඳු - සාපේක්ෂ වශයෙන් ග්‍රාහක ප්‍රතිචාර ප්‍රමාද වේ.

මෙයින් සත්‍ය වන්නේ,
01. කුමාර, සමන්, ලලිත් ඉදිරිපත් කළ ලක්ෂණ වේ.
02. සමන්, ලලිත්, කවිඳු ඉදිරිපත් කළ ලක්ෂණ වේ.
03. සමන්,කුමාර, කවිඳු ඉදිරිපත් කළ ලක්ෂණ වේ.
04. කුමාර, ලලිත්, කවිඳු ඉදිරිපත් කළ ලක්ෂණ වේ.

14 ප්‍රදීපාගාර සංකල්පය වඩාත් යෝග්‍ය වන්නේ,
01. සමූහ සන්නිවේදනයටය. 02. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයටය.
03. ජනසන්නිවේදනයටය. 04. අන්තර්පුද්ගල සන්නිවේදනයටය.

15. අමාලි තම පරිගණකයෙන් අන්තර්ජාලයට පිවිස මුහුණු පොතේ සැරිසරා, පුවත්පත් කියවා, ගුවන්විදුලියට සවන්දී රූපවාහිනිය නැරඹුවාය. ඇය භාවිතා කළ මාධ්‍ය හැඳින්වීමට වඩාත්ම යෝග්‍ය වන්නේ,
01. නූතන මාධ්‍යයයි. 02. අභිසාරී මාධ්‍යයයි.
03. සාම්ප්‍රදායික මාධ්‍යයයි. 04. තාක්ෂණික මාධ්‍යයයි.

16. ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය වඩාත් හොඳින් සිදුවන්නේ,
01. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේදී ය. 02 සමූහ සන්නිවේදනයේදීය.
03. අන්තර්පුද්ගල සන්නිවේදනයේදී ය. 04. ජනසන්නිවේදනයේදී ය.

17. විශ්වවිද්‍යාලයක ඉගෙනුම ලැබූ ශිෂ්‍යාවක් තවත් ශිෂ්‍යාවකට කඩේ ගොස් එනවිට තමාට "ආයකටු" රැගෙන එන ලෙස පවසා රු. 10.00ක් ලබාදුන්නාය. එහෙත් ඇය ආපසු පැමිණ පැවසුවේ "ආයකටු" නොතිබූ බවය. එහෙත් "ආයකටු" යනු හැට්ටකටු ලෙස ඇය දැනගත්තේ පසුවය. මෙය සන්නිවේදනයේ
01. මාධ්‍ය බාධකයකි. 02. පාරිසරික බාධකයකි.
03. අර්ථ බාධකයකි. 04. ශාරීරික බාධකයකි.

18. සංජානනය යනු,
01. විවිධ සංදේශ ග්‍රහණය කර ගැනීමයි. 02. සංදේශ ග්‍රහණය කරගෙන තේරුම් ගැනීමයි.
03. සංදේශ අවබෝධ කරගෙන ක්‍රියාත්මක විමයි. 04. ග්‍රාහකයාගේ අත්දැකීම් පසුතලයයි.

19. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
01. සන්නිවේදනය ගතික ක්‍රියාවලියකි.
02. සන්නිවේදන ක්‍රියාවලියේ ආරම්භකයා සන්නිවේදකයාය.
03. සන්නිවේදනයේ ප්‍රධානතම අරමුණ තොරතුරු සැපයීමය.
04. සන්නිවේදනය නිරන්තරයෙන්ම ද්විමාර්ගික ක්‍රියාවලියකි.

20. සන්නිවේදනයේ කාර්යයන් පිළිබඳ දැක්වූ අදහස් කීපයක් පහත දැක්වේ.
A - තොරතුරු සම්පාදනය මඟින් දෛනික වැඩකටයුතු සැලසුම් කරගැනීමට පහසුවේ.
B - පොත්පත් පරිශීලනය තුළින් මෙන්ම ගීත නාට්‍ය නැරඹීම තුළින්ද අධ්‍යාපනය ලබාදීම සිදුවේ.
C - ටෙලි නාට්‍ය නැරඹීම ගීත ශ්‍රවණය කිරීම තුළින් ලැබෙන්නේ විනෝදාස්වාදය පමණි.
D - සන්නිවේදනය තුළින් යහපත් ආකාරයේ පෙළඹවීම් මෙන්ම අයහපත් ආකරයේ පෙළඹවීම්ද සිදුවේ.

මෙයින් නිවැරදි ප්‍රකාශය වන්නේ,
01. A B හා C ය. 02. B C හා D ය. 03. A B හා D ය. 04. A C හා D ය.

21. භාෂාවේ මූලික කාර්යයක් නොවන්නේ,
01. සිතීම විධිමත් කිරීමය. 02. ලේඛන හැකියාව වර්ධනය කිරීමයි.
03. දැනුම සංරක්ෂණය කිරීමයි. 04. කාලය සන්නිවේදනය කිරීමයි.

22. වාචික සන්නිවේදන නිපුණතා වඩාත් වැදගත් නොවන්නේ,
01 ලේඛකයන්ට 02. ආගමික නායකයන්ට 03. නීතීඥයන්ට 04. ගුරුවරුන්ට

23. බස් රථයක ඉදිරි ආසනයට ඉහළින් " ආබාධිතයන් සඳහා" යනුවෙන් ප්‍රකාශයක් දක්වා තිබුණි. මෙය සන්නිවේදන ස්වරූපයේ
01. ලිඛිත සන්නිවේදනයි. 02. වාචික සන්නිවේදනයි.
03. විධිමත් සන්නිවේදනයි. 04. දෘශ්‍ය සන්නිවේදනයි.

24. අවාචික සන්නිවේදයේ සාමාජීය සාධකයට අනුව ඔබේ හිතවතාට මිතුරන් සිටින අවකාශය වන්නේ,
01. පෞද්ගලික අවකාශය. 02. පොදු අවකාශය.
03. සහෘද අවකාශය. 04. සාමාජීය අවකාශය.

25. ලිඛිත සන්නිවේදනය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
01. භාෂාව වාචික හා ලිඛිත ලෙස පැවතීම භාෂා ද්විරූපතාවයයි.
02. වාචික භාෂාවට වඩා ලිඛිත භාෂාව විධිමත් වේ.
03. ලේඛනය යනු භාෂාවේ ශ්‍රව්‍ය ස්වරූපයයි.
04. භාෂා භාවිතයේ දී ව්‍යාකරණ විධි අත්‍යවශ්‍යම නොවේ.

26.



මෙම රූප සටහන් අතුරින්,
01. සියල්ල නිර්වාචික වන අතර, සමහරක් දෘශ්‍ය සන්නිවේදනයක් සිදුකරයි.
02 සියල්ල නිර්වාචික වන අතර, සමහරක් වාචික සන්නිවේදනයක් සිදුකරයි.
03. සියල්ල සංකේත වන අතර, සමහරක් වාචික ස්වභාවයකත් දක්වයි.
04. සියල්ල සංකේත වන අතර, සමහරක් නිර්වාචික ස්වභාවයක් දක්වයි.

27. මංගල උත්සව දිනයකදී මනාලයාගේ පාර්ශවයේ පුද්ගලයෙකු මනාලියගේ නිවසට ඇතුල්වන විට මනාලියගේ පියා අතට බුලත් අතක් දෙන ලදි. එහි බුලත් කොළ 25 ක් ද බුලත් කොළ දෙකට ඉරන ලද බාග 04 ක් ද විය. මෙහි දැකිය නොහැක්කේ,
01. විධිමත් සන්නිවේදනයකි. 02. නිර්වාචික සන්නිවේදනයකි.
03. දෘශ්‍ය සන්නිවේදනයකි. 04. අවිධිමත් සන්නාවේදනයකි.

28. ශබ්ද විකාශන පද්ධති, ලිපි, දැන්වීම් භාවිතා වන්නේ,
01. විධිමත් සන්නිවේදනයේ පහළ සිට ඉහළට සන්නිවේදන සඳහාය.
02. අවිධිමිත් සන්නිවේදනයේ පහළ සිට ඉහළට සන්නිවේදනය සඳහාය.
03. විධිමත් සන්නිවේදනයේ ඉහළ සිට පහළට සන්නිවේදනය සඳහාය.
04. විධිමත් සන්නිවේදනයේ හරස් සන්නිවේදන සඳහාය.

29.


මෙයින් නිරූපණය වන්නේ,
01. චක්‍රීය ආකෘතියයි. 02. දාම ආකෘතියයි. 03. වයි ආකෘතියයි 04. රෝද ආකෘතියයි.

30. මරණාධාර සමිතියේ සභාපතිතුමා හදිසියේම කාරකසභාව රැස්කිරීමට තීරණය කර භාණ්ඩාගාරිකට පණිවිඩය දෙන ලදි. ඔහු ලේකම්ටත්, ලේකම් තවත් නිලධාරියෙකුටත් ලෙස පණිවිඩය දෙන ලද්දේ නම්, මෙහි භාවිතා වූ අවිධිමත් සන්නිවේදන දාමය වන්නේ,
    01. ඕපාදූප දාමය 02. තනි දාමය 03. සම්භාවිතා දාමයයි. 04. පරෂද දාමයයි.

31. ජීව දත්ත පත්‍රිකාවක් සැකසීමේ දී නොකළ යුත්තේ,
    01. වර්ණ අක්ෂර සහ කඩදාසි යොදා ගැනීම. 02. මූලික තොරතුරු කෙටියෙන් දැක්වීම.
    03. ආකර්ශනීය ලෙස ඉදිරිපත් කිරීම. 04 කඩදාසියේ වටේ ඉඩ තැබීම.

32. චිත්‍රයක් අඳිමින් සිටි අමාලි ලස්සන ගීතයක් ප්‍රචාරය වන හඬ ඇසී රූපවාහිනිය වෙත දුව ගොස් එය රසවින්දාය. පසුව ඇය තම නැගණිය සමඟ ගීතය පිළිබඳ අදහස් හුවමාරු කරගත්තාය. මේ තුළ දක්නට ලැබෙන සන්නිවේදන වර්ග වල අනුපිළිවෙල වන්නේ,
    01. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය, ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදනය, ජනසන්නිවේදනය.
    02. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය, ජනසන්නිවේදනය, අන්තර්පුද්ගල සන්නිවේදනය.
    03. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය, දෘශ්‍ය සන්නිවේදනය, ජනසන්නිවේදනය.
    04. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය, ලිඛිත සන්නිවේදනය, අන්තර්පුද්ගල සන්නිවේදනය.

33. ආවාචික සන්නිවේදනය වඩාත් ඉස්මතු වී පෙනෙන අවස්ථාවක් වන්නේ,
    01. මෘත දේහයකට අවසාන ගෞරවය දක්වන අවස්ථාවකදී ය.
    02. මංගල උත්සව අවස්ථාවකදී ය.
    03. හදිසි අනතුරක් සිදු වූ අවස්ථාවකදී ය.
    04. අධ්‍යාපන චාරිකාවක් යන අවස්ථාවකදී ය.

34. පහත සඳහන් මාධ්‍ය කාණ්ඩ අතරින් නූතන මාධ්‍ය කාණ්ඩයට ඇතුළත් වන්නේ,
    01. අන්තර්ජාලය හා ජංගම දුරකථනයයි. 02. සිනමාව හා අන්තර්ජාලයයි.
    03. ජංගම දුරකථනය හා ගුවන් විදුලියයි. 04. රූපවාහිනිය හා ගුවන් විදුලියයි.

35. අන්තර්පුද්ගල සන්නිවේදනය බොහෝ විට,
    01. වාචික හා නිර්වාචික සන්නිවේදනයේ එකතුවකි. 02. ශ්‍රව්‍ය හා ලිඛිත සන්නිවේදනයේ එකතුවකි.
    03. අවධිමිත් හා වාචික සන්නිවේදනයේ එකතුවකි. 04. වාචික හා ශ්‍රව්‍ය සන්නිවේදනයේ එකතුවකි.

36. පුවත්පත, ගුවන් විදුලිය, රූපවාහිනිය, අංගචලනය යන මාධ්‍ය වලට ආදළ සන්නිවේදන ස්වරූප අනුපිළිවෙන වන්නේ,
    01. ශ්‍රව්‍ය, ශ්‍රව්‍ය දෘශ්‍ය, ලිඛිත, අවාචික 02. ශ්‍රව්‍ය දෘශ්‍ය, ශ්‍රව්‍ය, ලිඛිත, අවාචික වේ.
    03. ලිඛිත, ශ්‍රව්‍ය, ශ්‍රව්‍ය දෘශ්‍ය, අවාචික වේ. 04. ශ්‍රව්‍ය, ලිඛිත, ශ්‍රව්‍ය දෘශ්‍ය, අවාචික වේ.

37. අවිධිමත් සන්නිවේදනය පිළිබඳ පංති කාමරයක් තුළ පහත සඳහන් අදහස් මතුවිය.
    A - අවිධිමත් සන්නිවේදනය වේගයෙන් පැතිරේ.
    B - නිසි බලධාරියෙකු දක්නට නොලැබේ.
    C - අවිධිමත් සන්නිවේදනයේ ආරම්භය කොතනින් සිදුවූ වා දැයි කිව නොහැක.
    D - අවිධිමත් සන්නිවේදනය සමාජ අවශ්‍යතාවයකි.

    ඉහත ප්‍රකාශ අතුරෙන්
    01. AB හා C පමණක් නිවැරදිය. 02. BC හා D පමණක් නිවැරදිය.
    03 BC හා A පමණක් නිවැරදිය. 04. ABCD සියල්ල නිවැරදිය.

38. සන්නිවේදන අරමුණු සමඟ නොගැළපෙන යෙදුමක් සහිත කාණ්ඩය වන්නේ,
    01. තොරතුරු සම්පාදනය, සමාජානුයෝජනය, සංවාද හා සාකච්ඡා
    02. තොරතුරු සම්පාදනය, සමාජ ඒකාබද්ධතාවය, ප්‍රතිපෝෂණය,
    03. අධ්‍යාපනය ලබාදීම, සමාජානුයෝජනය, සංවාද හා සාකච්ඡා
    04. සංස්කෘතික ප්‍රගමනය, සමාජ ඒකාබද්ධතාවය, සමාජානුයෝජනය

39. මංගල අවස්ථාවකදී භාවිතයට ගැනෙන ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනය සංකේතයක් වන්නේ,
    01. මංගල රථ හා කොඩි දැමීම. 02. රතිඤ්ඤා පත්තු කිරීම හා තොරණ ගැසීම.
    03. අෂ්ඨක කීම හා ජයමංගල ගාථා කීම. 04. අතපැන් වත් කිරීම හා බුලත් මාරුකිරීම.

40. රූපවාහිනී වැඩසටහන් සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති පහත මත අතරින් අසත්‍ය වන්නේ,
    01. දෛනික ජීවිතය වෙනස් කරයි.
    02. විවිධ චිත්තාවේග වැඩිදියුණු කරයි.
    03. නිරන්තරයෙන් සමාජ යථාර්ථයන් පුද්ගලයා තුළ ගොඩනගයි.
    04. පරිභෝජන රටා වෙනස් කරයි.

සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

87 S II

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018
## First Term Test - Grade 10 - 2018

විභාග අංකය .................................... සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය II කාලය පැය 02 යි.

වැදගත් :

* පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

01. වයඹ පළාතේ බොහෝ පාසල්වල මාධ්‍ය සමාජ පිහිටුවා ඇත. ඒ මඟින් පාසල් තුළ විශාල කාර්යභාරයක් සිදුවේ. ඔබ පාසලේ ඇති මාධ්‍ය සමාජයේ සභාපති ඔබයි.

   i. පාසලේ මාධ්‍ය දිනය පිළිබඳ මූලික සාකච්ඡාව විදුහල්පතිතුමා සමග සිදුකළ යුතු බව මාධ්‍ය සමාජය භාර ගුරුතුමා ඔබට පැවසුවේය. මෙම අවස්ථාව කුමන සන්නිවේදන වර්ගයකට අයත්ද?
   ii. මාධ්‍ය දිනය සඳහා ගුවන් විදුලි විකාශයක් කිරීම සුදුසු බව බොහෝ දෙනාගේ අදහස විය. ගුවන් විදුලිය අ යත් සන්නිවේදන වර්ගය හා ස්වරූපය දක්වන්න.
   iii. මේ සඳහා පාසල් සිසුන් හා දෙමාපියන් දැනුවත් කළ යුතුය. ඒ සඳහා භාවිතා කළ හැකි සන්නිවේදන ක්‍රම 2 ක් ලියා දක්වන්න.
   iv. මාධ්‍ය දිනය පිළිබඳ ප්‍රචාරණය ලබා දිය හැකි ලිඛිත සන්නිවේදන ක්‍රම 02 ක් නම් කරන්න.
   v. හරස් සන්නිවේදනය මඟින් මාධ්‍ය දිනය පිළිබඳ ආරංචිය පාසල පුරා පැතිර ගිය බව මනෝජ් කීවේය. හරස් සන්නිවේදනය යනු කුමක් දැයි පහදන්න.
   vi. මාධ්‍ය දිනය පිළිබඳ දැන්වීමක් නිර්මාණය කරන්නට ඔබට පැවරුණි නම් එහි අවශ්‍යයෙන්ම තිබිය යුතු කරුණු 04 ක් ලියන්න.
   vii. මාධ්‍ය දිනයට ජනමාධ්‍ය ඇමතිවරයා පැමිණෙන බවට කටකතාවක් පැතිරගොස් තිබේ. එම සිදුවීමට අදාළ සන්නිවේදන ස්වරූප මොනවාද?
   viii. සාම්ප්‍රදායික ක්‍රමයට ප්‍රචාරණය දීම සුදුසු බව මාධ්‍ය සමාජයේ බොහෝ දෙනාගේ අදහස විය. එලෙස භාවිතා කළ හැකි පැරණි සන්නිවේදන ක්‍රම 02 ක් නම් කරන්න.
   ix. මෙම මාධ්‍ය දිනය පිළිබඳ පුවත්පතකට ඔබ ලියූ ලිපිය කියවූ විදුහල්පතිතුමා එහි තිබූ සමහර තොරතුරු ඉවත් කළේය. මේ අවස්ථාවට අදාළ සන්නිවේදන සංකල්ප කුමක්ද?
   x. මාධ්‍ය දිනයට සැදූ දැන්වීමේ අකුරු වැරදි රැසක් ඇති බව සිංහල ගුරුතුමා කීවේය. එය කුමන සන් නි වේදන බාධකයක්ද?

02. i. සන්නිවේදන ආකෘති රැසක් දක්නට ලැබේ. ඒ අතරින් ගණිතමය සන්නිවේදන සූත්‍රය හඳුන්වා දුන්නේ කවුරුන්ද?
   ii. එම ගණිතමය සූත්‍රය ඇඳ නම් කරන්න.
   iii. ඒක මාර්ගික සන්නිවේදනය ලැස්වෙල්ගේ ආර්ථ කථනය අනුව කෙටියෙන් විස්තර කරන්න.
   iv. ද්විමාර්ගික සන්නිවේදනයේ ස්වභාවය කුමක්ද? රූපසටහන් ඇසුරින් පැහැදිලි කරන්න.

03. i. සන්නිවේදනයේ මූලික කාර්යයන් 04 ක් දක්වන්න.
   ii. ඉන් කරුණු 02 ක් පැහැදිලි කරන්න.
   iii. සංජානනය යනු කුමක්ද ? ඊට බාධා පැමිණෙන හේතු 04 ක් ලියා දක්වන්න. එකක් විස්තර කරන්න.
   iv. සන්නිවේදන බාධක 02 ක් නම්කර ඒවා පිළිබඳ විස්තර කරන්න.

04. ආච්චි උදෙන්ම අවදි වී භාවනා කොට, ගුවන් විදුලිය ක්‍රියාත්මක කළාය. අම්මා තේ කෝප්පයක් සාදා ආච්චිට බොන්නට දුන්නේ සීනි ඇත්දැයි අසමිනි.
   i. ඉහත සිදුවීමේ ඇති සන්නිවේදන වර්ග නම් කරන්න.
   ii. දුරකථනය කුමන සන්නිවේදන වර්ගයකදී භාවිතා කළ හැකිද? දුරකථන භාවිතයේ දී අනුගමනය කළ යුතු පිළිවෙත් 2 ක් ලියන්න.
   iii. ප්‍රදීපාගාර උපක්‍රමය යොදාගත හැක්කේ කුමන සන්නිවේදන වර්ගයකදීද? ප්‍රදීපාගාර උපක්‍රමය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.
   iv. ජනසන්නිවේදනයේ දී භාවිතා කරන ජනමාධ්‍ය 03 ක් නම් කරන්න. ජනසන්නිවේදනයේ මූලික ස්වභාවය කරුණු 04 ක් ඇසුරින් පහදන්න.

05. i. භාෂාවේ මූලික කාර්යයන් 02 ක් ලියන්න.
ii. අවාචික සන්නිවේදනය ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| සමාජීය සාධක | පාරිසරික සාධක | ශාරීරික සාධක |
|---|---|---|
| | | |
| | | |
| | | |

iii. වාචික සන්නිවේදනයේ සාර්ථකත්වය සඳහා බලපාන භාෂාව සම්බන්ධ අංග 03 නම් කර පැහැදිළි කරන්න.
iv. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය යනු කවරේදැයි හඳුන්වා වර්තමානයේ එහි භාවිතය පිළිබඳ විස්තර කරන්න.

06. i. සන්නිවේදනයේ දී භාෂාව ප්‍රබල මෙහෙයක් ඉටු කරයි. භාෂා ද්විරූපතාව යනු කුමක්දැයි හඳුන්වන්න.
ii. අභිසාරී මාධ්‍ය යනු කුමක්ද? කෙටියෙන් පැහැදිළි කරන්න.
iii. ජංගම දුරකථනයකින් ඇමතුම් ගැනීමට අමතරව ලබාදෙන වෙනත් පහසුකම් දෙකක් ලියාදක්වන්න. ජංගම දුරකථන භාවිතයේ දී අද සමාජයේ පැනනඟින ගැටළු කෙටියෙන් හඳුන්වන්න.
iv. ජනමාධ්‍ය හා සමාජය අතර ඇති සබඳතාව නිසා ජනසන්නිවේදනය නූතන සමාජයේ පැවැත්මට බලපායි. කරුණු 04 ක් ඇසුරින් විස්තර කරන්න.

07. i. ආදි මානව සන්නිවේදනය පිළිබඳව තොරතුරු ලබාගත හැකි ලෝ ප්‍රකට පැරණිම ගුහා චිත්‍ර හමුවී ඇති ස්ථාන 02 නම් කරන්න.
ii. සම්ප්‍රදායික හා නූතන දෘශ්‍ය මාධ්‍ය 02 බැගින් නම් කරන්න.
iii. පුද්ගලයෙකුගේ සන්නිවේදන කාර්යය ආරම්භ වන්නේ කුමන සන්නිවේදන වර්ගයකින්ද? එහි විශේෂතා කරුණු 04 ක් ඇසුරින් පැහැදිළි කරන්න.
iv. වර්තමාන සමාජ ජාලා වෙබ් අඩවි නිසා ළමා හා තරුණ පිරිස් පොතපත භාවිතයෙන් ඈත් වේ. මේ පිළිබඳ කරුණු 04 කින් ඔබේ අදහස් පැහැදිළි කරන්න.

පළමු වාර පරීක්ෂණය - 2018
10 ශ්‍රේණිය
සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - විසඳුම් පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | - 1 | 11 | - 2 | 21 | - 2 | 31 | - 1 |
| 2 | - 3 | 12 | - 4 | 22 | - 1 | 32 | - 2 |
| 3 | - 2 | 13 | - 4 | 23 | - 4 | 33 | - 1 |
| 4 | - 2 | 14 | - 1 | 24 | - 1 | 34 | - 4 |
| 5 | - 3 | 15 | - 2 | 25 | - 3 | 35 | - 1 |
| 6 | - 1 | 16 | - 3 | 26 | - 4 | 36 | - 3 |
| 7 | - 4 | 17 | - 3 | 27 | - 4 | 37 | - 4 |
| 8 | - 4 | 18 | - 2 | 28 | - 3 | 38 | - 2 |
| 9 | - 1 | 19 | - 4 | 29 | - 1 | 39 | - 2 |
| 10 | - 3 | 20 | - 3 | 30 | - 2 | 40 | - 3 |

(1x40 = 40)

## II කොටස

01. i. අන්තර් පුද්ගල සන්නිවේදනය (ල. 02)
ii. ජනසන්නිවේදනය, ශ්‍රව්‍ය සන්නිවේදනය (ල. 02)
iii. උදෑසන රැස්වීම, දෙමාපිය රැස්වීම, දෙමාපියන්ට ලිපියක් දැමීම (ල. 02)
iv. දැන්වීම්, පෝස්ටර්, අත්පත්‍රිකා, බැනර් (ල. 02)
v. ආයතනයක් තුළ ඒ ඒ මට්ටම්වල කාර්යමණ්ඩල අතර ක්‍රියාත්මක වන සන්නිවේදනය. පාසලේ නම් දරුවන් අතර, ගුරුභවතුන් අතර (ල. 02)
vi. දිනය, වේලාව, ස්ථානය, කාරණය, සහභාගී වන අය, සංවිධානය (ල. 02)
vii. අවිධිමත් සන්නිවේදනය / වාචික සන්නිවේදනය (ල. 02)
viii. අණබෙරය, කවිකොළ, ගස්වල දැන්වීම් ඇලවීම (ල. 02)
ix. දොරටුපාල සංකල්පය (ල. 02)
x. මාධ්‍ය බාධකයක් (ල. 02)
(ලකුණු 20)

02. i. ක්ලෝඩ් ෂැනෝන් හා වොරන් වීවර්
ii.




iii. මෙහිදී සන්නිවේදනය එක් පැත්තක පමණක් සිදුවේ. පණිවිඩකරු / නිවේදකයා කියනදේට තෝරාගත් මාධ්‍යයක් ඔස්සේ ග්‍රාහකයාට ලබාදෙයි. ග්‍රාහකයා තුළ වෙනසක් ඇති වේ. (ල. 3)
iv. සන්නිවේදකයාගෙන් ග්‍රාහකයාටත් ග්‍රාහකයාගෙන් සන්නිවේදකයාටත් පණිවිඩ, ප්‍රතිචාර ලැබේ. (ල. 04)



03. i. තොරතුරු සැපයීම, අධ්‍යාපනය ලබාදීම, විනෝදාස්වාදය ලබාදීම, පෙළඹවීම, සමාජානුයෝජනය .... (ල. 01)
ii. කෙටි පැහැදිලි කිරීමකට ලකුණු ලබා දෙන්න. (ල. 02)
iii. කෙනෙකුගේ පංචේන්ද්‍රිය මඟින් ලැබෙන විවිධ සන්දේශ ග්‍රහණය කරගෙන එය තේරුම් ගැනීම
- ❖ සංජානනයයි.
- ❖ සන්දේශය තුළ විවිධ අර්ථ තිබීම
- ❖ වැරදි තොරතුරු ගොනුකර සන්දේශය සැකසීම.
- ❖ සන්දේශයේ තොරතුරු විකෘතිව තිබීම.
- ❖ ග්‍රාහකයාගේ අත්දැකීම් පසුතලයට හසු නොවීම.

iv. මාධ්‍ය බාධක, අර්ථ බාධක (විස්තර කිරීමටද සහිතව ලකුණු ලබාදෙන්න) (ල.04)

04. i. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය, ජන සන්නිවේදනය, අන්තර් පුද්ගල සන්නිවේදනය (ල. 01)
ii. අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී
missed call වලට නොඇමතීම
අවශ්‍ය කරුණු කතා කිරීමට භාවිතා කිරීම.
අනික් පස සිටින්නාට ආචාරශීලීව කතා කිරීම. (ල. 02)
iii. සමූහ සන්නිවේදනයේදී
සමූහයේ සියලු දෙනා කෙරෙහි ඇස් සම්බන්ධතාව තබා ගැනීම. (ල. 03)
iv. රූපවාහිනිය, ගුවන් විදුලිය, පුවත්පත, සිනමාව
සන්දේශය පොදු වූවකි.
සන්නිවේදකයා ග්‍රාහකයා අභිමුඛ නොවේ. (පෙළ පොතේ 35)

05. i. සිතීම විධිමත් කිරීම, සැබෑව හඳුනා ගැනීම, වාචික ප්‍රකාශන, කාලය සන්නිවේදනය (ල.01)
ii.

| සමාජීය සාධක | පාරිසරික සාධක | ශාරීරික සාධක |
|---|---|---|
| පොදු අවශ්‍යතා | මේසය, උද්‍යානය | මුහුණේ ඉරියව් |
| පෞද්ගලික | බිත්තිවල වර්ණ | ඇස්වල හැසිරීම් |
| අවකාශය | ගෘහභාණ්ඩ | හඬ, නිහඬව |

(ල.02)

iii. උච්චාරණය, අර්ථ ගැන්වීම, යෝග්‍යතාව (පැහැදිලි කිරීමටද සහිතව ලකුණු ලබා දෙන්න) (ල.03)
iv. අසන, දකින දෙකම තිබෙන මාධ්‍ය (විස්තරයටද සහිතව ලකුණු ලබාදෙන්න) (ල.04)

06. i. වාචික හා ලිඛිත ලෙස භාෂාව පැවතීම (ල. 01)
ii. සියලු මාධ්‍ය එකට එකතුවීම. (ල. 02)
iii. කැමරාව, ගණක යන්ත්‍රය, අන්තර්ජාල පහසුකම් ආදිය
ගැටළු - අනවශ්‍ය ඇමතුම් ලබාදීම, අනවශ්‍ය පින්තූර ලබාගැනීම, රහසින් පටිගත කිරීම් ආදිය නිසා මතුවන ගැටළු ........ (ල. 03)
iv. දෛනික ජීවිතය වෙනස්වීම, පරිභෝජන රටාව වෙනස් කිරීම (පෙළපොතේ 37 පිටුව) ආදී ලෙස ..........
(ල. 04)

07. i. ප්‍රංශයේ ලැස්කෝ, ස්පාඤ්ඤයේ අල්ටිමීරා (ල. 01)
ii. සම්ප්‍රදායික - දුම්ගැසීම, කොලඅතු එල්ලීම, කොඩි දැමීම.
නූතන - බැනර්, මාර්ග සංඥා ආදී සුදුසු පිළිතුරකට ලකුණු ලබාදෙන්න. (ල. 02)
iii. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය.
සිතිවිලි හැඟීම් මත සන්නිවේදනය සිදු වීම. (පෙළපොතේ 25 පිටුව) (ල. 03)
iv. පිළිතුරේ ආකාරයට ලකුණු දෙන්න. (ල. 04)